| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date: 2023-02-08 |

පැමිණිලි පාර්ශවය : කේ. හේමලතා මිය,
05 කණුව, මහමීගස්වැව
නාමල්පුර

වී.මහින්දපාල - අගතියට පත් අය

වගඋත්තර පාර්ශවය :

01 උ.පො.ප - එම්.ජී.ඒ.අයි.වීරසිංහ මයා,
පොලිස් ස්ථානය, හබරණ.

02. පො.සැ 59629 - එස්. විජේකුමාර මයා,
පොලිස් ස්ථානය, හබරණ.

03. පො.කො 50508 - ජේ.ඒ.ප්‍රියන්ත අමරසේන මයා,
පොලිස් ස්ථානය, හබරණ.

04. පො.කො 86727 - එච්.එම්.එම්.කප්ලාන් මයා,
පොලිස් ස්ථානය, හබරණ.

05. පො.කො 86732 - එම්.එස්.ප්‍රේමතිලක මයා,
පොලිස් ස්ථානය, හබරණ.

පැමිණිලි අංකය : HRC/AP/521/2016(S)

**පැමිණිල්ල :-**

කේ. හේමලතා යන අය විසින් මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ලක් ගොනු කරමින් සඳහන් කර ඇත්තේ, 2016.09.09 වන දින තම සැමියා වන වී.මහින්දපාල තම හේනට යාමට සූදානම්ව සිටියදී යතුරුපැදිවලින් පොලිස් නිලධාරීන් කිහිප දෙනෙකු තම නිවසට පැමිණි බවත්, එසේ පැමිණ 'තමා සන්තකයේ ඇති කසිප්පු දීපන්' යැයි පැවසූ බවත්, ස්වාමියා ළඟ කසිප්පු නොමැති බව පැවසූ විට පොලිස් නිලධාරීන් අතරින් එක් අයෙක් තම සැමියාට පොල්ලක් ගෙන පහර දුන් බවත්, අනෙක් නිලධාරීන් එකතු වී ඔවුන්ගේ කලිසමක පටියක් ගලවා ස්වාමියාගේ අත් දෙක පිටුපසට කර බැඳ පාරවල් දෙකක් ගසා යතුරුපැදිවලින් රැගෙන ගිය



ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R.A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர் / Chairperson: 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541/ 74
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrcsl@gmail.com
උරකථන ලේකම් ක්ෂණික වෙබ්

බවත්ය. 2016.09.09 දින ප.ව.1.30 ට පමණ තමන් හබරණ පොලිසියට ගිය බවත්, එහිදී තම ස්වාමියාගේ උරහිසේ තුවාලයක් තිබූ අතර, එහිදී පොලිස් නිලධාරීන් කළ පහර දීමෙන් තුවාල වූ බව තම ස්වාමියා තමා වෙත පවසා සිටි බවත් සඳහන් කර ඇත.

අගතියට පත් ටී.මහින්දපාල මහතා ප්‍රකාශ කර ඇත්තේ, 2016.09.09 දින තම හේනට යාමට සූදානම්ව සිටියදී යතුරුපැදි දෙකකින් තිදෙනෙකු තම නිවයට පැමිණ තමාගෙන් අරක්කු බවත්, 'අරක්කු නැහැයි' කියූ විට ගේ පිටුපසට රැගෙන ගොස් තම අත්දෙක පිටුපසට බැඳ පහර දුන් බවත්, පසුව පොලීසියට රැගෙන ගොස් අමානුෂික ලෙස පහර දුන් බවත්ය.

**වගඋත්තර පාර්ශවයේ කරුණු දැක්වීම :-**

අංක OIC/14742/16 හා 2016.10.26 දිනැති වාර්තාව මගින් ස්ථානාධිපතිවරයා දන්වා ඇත්තේ, ටී.මහින්දපාල යන අයව අත්අඩංගුවට ගෙන ඇත්තේ, බුද්ධි අංශ නිලධාරීන්ට ලද තොරතුරු මත වැටලීමක් සිදු කිරීමෙන් පසුව බවය. 2016.09.09 දින පැය 12.10 ට නීතිවිරෝධී මත්පැන් පෙරීමට ගන්නා බැරලයක් හා දඟරයක් හා ගෝඩා මිලිලීටර 12000ක් ළඟ තබා ගෙන සිටියදී අත්අඩංගුවට ගත් බවත්, 2016.09.10 දින පැය 10.10 ට පොලිස් ඇපමත මුදාහැර ඇති බවත්, පහරදීම සම්බන්ධයෙන් කරන චෝදනාව ප්‍රතික්ෂේප කරන බවත් දක්වා ඇත.

**නිරීක්ෂණ :-**

පැමිණිලිකරු ප්‍රධාන කොටම තම පැමිණිල්ල මගින් සඳහන් කර ඇත්තේ, 2016.09.09 දින තමන් නිවසේ සිටියදී වගඋත්තරකරුවන් නිවසට පැමිණ අත්අඩංගුවට ගෙන පහරදී පොලීසිය වෙත ද රැගෙන ගොස් අමානුෂික ලෙස පහරදී වධහිංසා කර තම අයිතිවාසිකම් උල්ලංඝනය කරන ලද බවයි.

වගඋත්තරකරුවන් සඳහන් කර ඇත්තේ, පැමිණිලිකරු නීත්විරෝධී සන්තකයේ දරමින් සිටියදී වරද කියා දී අත්අඩංගුවට ගත් බවත්, පහරදීමේ චෝදනාව ප්‍රතික්ෂේප කරන බවත්, වගඋත්තරකරුවන්ගේ ක්‍රියාවන් හේතුවෙන් පැමිණිලිකරුගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනයක් සිදුව නොමැති බවත්ය.

පැමිණිලිකරුගේ බිරිඳ කේ.හේමලතා හා පැමිණිලිකරු විසින් කොමිෂන් සභාව වෙත යොමුකර ඇති පැමිණිලි අනුව පැමිණිලිකරුව 2016.09.09 දින පෙරවරුවේ පැමිණිලිකරුගේ නිවසේ දී අත්අඩංගුවට ගෙන ඇති බව නිරීක්ෂණය වේ.

වගඋත්තරකරුවන් විසින් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති උධෘත හා දිවුරුම් ප්‍රකාශ අනුව පැමිණිලිකරුව ඔහුගේ හේන අසල 05 කණුව අසලදී අත්අඩංගුවට ගෙන ඇති බව නිරීක්ෂණය වේ.

2016.09.09 දින පෙරවරුවේදී පැමිණිලිකරු තම නිවසේ සිටියදී හා කිසිදු නීති විරෝධී සන්තකයන් නොදරමින් සිටියදී වගඋත්තරකරුවන් විසින් අත්අඩංගුවට ගත් බව පැමිණිල්ල මගින් දන්වා ඇති බැවින්, පැමිණිලිකරුව

තම නිවසේ සිටියදී අත්අඩංගුවට ගත් බව සනාථ කරන සාක්ෂි ඉදිරිපත් කිරීමට පැමිණිලිකරුට අවස්ථාව ලබා දී ඇති අතර, පැමිණිලිකරු තමන්ව නීති විරෝධී ආකාරයට අත්අඩංගුවට පත් වූ බවට සනාථ කරන සාක්ෂි කිසිවක් කොමිසම වෙත ඉදිරිපත් කර නොමැත. ඒ අනුව පැමිණිලිකරුව ඔහුගේ නිවසේ සිටියදී මෙන්ම නීතිවිරෝධී සන්තකයක් නොදරමින් සිටියදී අතඅඩංගුවට පත් වූ බවට ප්‍රබල සාක්ෂි ඉදිරිපත් වී නොමැති බැවින් පැමිණිලිකරු විසින් වගඋත්තරකරුවන්ට එරෙහිව කරනු ලබන නීතිවිරෝධී ලෙස අත්අඩංගුවට ගැනීමේ චෝදනාවට අදාළ නිර්දෝශීභාවය පිළිබඳව නිරීක්ෂණ සටහන් කිරීමේ හැකියාවක් නොමැත.

ඉහත කරුණු අනුව වගඋත්තරකරුවන් විසින් පැමිණිලිකරුව නීත්‍යානුකූල නොවන ආකාරයට අත්අඩංගුවට ගෙන ඇති බවට ප්‍රබල සාක්ෂියක් ඉදිරිපත් නොවන බැවින්, වගඋත්තරකරුවන්ගේ ක්‍රියාවන් හේතුවෙන් පැමිණිලිකරුගේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයේ 13(1) හි සඳහන් අයිතිවාසිකම් උල්ලංඝනය වීමක් සිදුව නොමැති බව නිරීක්ෂණය කරනු ලබයි.

පැමිණිලිකරුව අත්අඩංගුවට ගැනීමෙන් පසුව පැමිණිලිකරුට වගඋත්තරකරුවන් කිහිප දෙනෙකු විසින් අමානුෂික ලෙස පහර දුන් බව පැමිණිල්ල මඟින් දන්වා ඇත. පැමිණිලිකරුට අමානුෂික ලෙස පහරදීම සිදුකරන ලද්දේ පොලිස් කොස්තාපල් 86732 මිලාන් ප්‍රේමතිලක, පොලිස් සැරයන් 59629 විජේකුමාර, උප පොලිස් පරීක්ෂක අසංක යන පොලිස් නිලධාරීන් බව පැමිණිල්ලෙන් දක්වා ඇත.

පැමිණිලිකරු 2016.09.09 දින අත්අඩංගුවට ගෙන 2016.09.10 දින පොලිස් ඇප මත මුදාහැර ඇති බවට නිරීක්ෂණය වන අතර, පැමිණිලිකරු 2016.09.10 දින ප්‍රතිකාර ලබා ගැනීම සඳහා කැකිරාව රෝහලට ඇතුළත් වී 2016.09.11 වන දින අනුරාධපුර ශික්ෂණ රෝහල වෙත යොමු කර ඇති බව නිරීක්ෂණය වේ.

වගඋත්තරකරුවන් විසින් පැමිණිලිකරුට සිදුකරන ලදැයි පවසන පහරදීම සම්බන්ධයෙන් අනුරාධපුර ශික්ෂණ රෝහල වෙතින් වෛද්‍ය වාර්තාවක් කැඳවා ඇති අතර, එම වෛද්‍ය වාර්තාව අනුව පැමිණිලිකරු ප්‍රතිකාර ලබා ගැනීම සඳහා 2016.09.11 දින ඇතුළත් වී 2016.09.15 දින රෝහලෙන් මුදාහැර ඇති බව නිරීක්ෂණය වේ. එමෙන්ම 2016.09.15 දින පැමිණිලිකරු අධිකරණ වෛද්‍ය පරීක්ෂණයන්ට භාජනය කර ඇත.

ඒ අනුව අධිකරණ වෛද්‍ය නිලධාරී විසින් පැමිණිලිකරුට අදාළව ලබා දී ඇති අධිකරණ වෛද්‍ය වාර්තාව අනුව පැමිණිලිකරුගේ තුවාල පහත පරිදි සටහන් කර ඇත.

Injuries:-

1. cervical collar for chip fracture of 7th cervical vertebra.
2. 20% size ear drum preparation on left ear.
3. Abrasion 3x3 cm on tip of tight shoulder.
4. Swelling of right ankle join.

එමෙන්ම රෝගියා විසින් ලබා දී ඇති කෙටි ඉතිහාසය ඉහත තුවාල සමඟ සැසඳෙන බවට වෛද්‍ය මතය ලබා දී ඇති අතර, එහි තුවාල අංක 01 බරපතල තුවාල ලෙසටද සටහන් කර ඇත.

පැමිණිලිකරුට ඉහත නම් සඳහන් වගඋත්තරකරුවන් තිදෙනෙකු විසින් පහරදුන් බව ප්‍රකාශ කළද, අදාළ වගඋත්තරකරුවන් පහරදීමේ චෝදනාව තරයේ ප්‍රතික්ෂේප කර ඇත.

වගඋත්තරකරුවන් මේ සම්බන්ධයෙන් ප්‍රකාශ කර ඇත්තේ, පැමිණිලිකරු නීතිවිරෝධී මත්පැන් සන්තකයේ දරමින් සිටින අවස්ථාවේදී ඔහුව අත්අඩංගුවට ගැනීමට වගඋත්තරකරුවන් කටයුතු කළ බවත්, එහිදී පැමිණිලිකරු වගඋත්තරකරුවන්ගෙන් මිදී පළා ගිය බවත්, පලායන විට වගඋත්තරකරුවන් පැමිණිලිකරු අල්ලා ගැනීමට ඔහු පසුපස ගිය බවත්, පැමිණිලිකරු එම අවස්ථාවේදී ඇලකට වැටුණු බවත්, එසේ වැටීමෙන් පසුවද පැමිණිලිකරු පලා ගිය බවත්ය. පැමිණිලිකරුව අත්අඩංගුවට ගැනීමෙන් පසු ඔහුට සිදුව තිබූ තුවාල පිළිබඳ සටහනක් යොදා ඇති බවද දක්වා ඇත.

වගඋත්තරකරුවන්ගේ වැටලීම් සටහන් අනුව පැමිණිලිකරු ඇළ වැටීමෙන් පැමිණිලිකරුගේ දකුණු උරහිසේ තුවාල ඇති බවට සටහන් යොදා ඇත.

වගඋත්තරකරුවන් විසින් ඉදිරිපත් කර ඇති සියලුම ලේඛන හා උධෘත අනුව පැමිණිලිකරුව අත්අඩංගුවට ගැනීමට කටයුතු කිරීමේදී පැමිණිලිකරු පොලිස් නිලධාරීන්ගෙන් මිදී පලාගොස් ඇති අයෙකු බව නිරීක්ෂණය වේ. එමෙන්ම වගඋත්තරකරුවන් විසින් පැමිණිලිකරුව ලුහුබැඳ ගොස් අත්අඩංගුවට ගැනීම සිදුකර ඇති බවද නිරීක්ෂණය වේ. එමෙන්ම පැමිණිලිකරුගේ ක්‍රියාකලාපය හේතුකොට ගෙන ඔහුට තුවාල සිදුව ඇති බවට වගඋත්තරකරුවන් ඔවුන්ගේ නිරීක්ෂණ සටහන් යොදා ඇත. වගඋත්තරකරුවන්ගේ මෙකී ප්‍රකාශ සම්බන්ධයෙන් පැමිණිලිකරු විරෝධය පළකිරීමක් සිදුකර නොමැත.

වගඋත්තරකරුවන්ගේ උධෘත මඟින් පැමිණිලිකරුව ඇලකට වැටීමෙන් පසුව ඔහුගේ දකුණු උරහිසේ තුවාල ඇති බවට සටහන් යොදා ඇත. එමෙන්ම අධිකරණ වෛද්‍ය නිලධාරීගේ වාර්තාවේ ද පැමිණිලිකරුගේ උරහිසේ තුවාල පවතින බවට සටහන් කර ඇත.

2017.04.26 දින කොමිෂන් සභාවේ පැවති පරීක්ෂණයේ දී පැමිණිලිකරු ප්‍රකාශ කර ඇත්තේ, පොලිස් කොස්තාපල් මිලාන් 86732 විසින් දර පොල්ලකින් තම කකුලට හා පිටට පහර දෙකක් ගැසූ බවය.

වගඋත්තරකරුවන්ගේ ප්‍රකාශයන් පැමිණිලිකරුගේ ප්‍රකාශයන් හා අධිකරණ වෛද්‍ය නිලධාරීගේ වෛද්‍ය වාර්තාවේ සඳහන් කරුණුද සලකා බැලීමේදී පැමිණිලිකරුගේ උරහිසේ පවතින තුවාල පැමිණිලිකරු ඇළට වැටීමෙන් සිදු වූ තුවාල බවට පිළිගැනීමේ හැකියාවක් පවතින අතර, එම තුවාල පොලිස් කොස්තාපල් 86732 මිලාන් විසින් පොල්ලකින් සිදුකළ පහර දීමෙන් සිදු වූ තුවාල බවට ද පිළිගැනීමේ හැකියාවක් ද පවතී.

පැමිණිලිකරු මෙදින පරීක්ෂණයේ දී වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත්තේ, උප පොලිස් පරීක්ෂක අසංක යන අය තම කම්මුලට පහරක් ගැසූ බවත්, එම පහර කණ හරහාද වැදුනු බවත්, එහිදී තම කණ නොඇසී ගිය බවත්ය.

අධිකරණ වෛද්‍ය නිලධාරීන්ගේ වෛද්‍ය වාර්තාවේ 20% Size ear drum perforation in left ear ලෙස සඳහන් වන අතර, ඒ අනුව පැමිණිලිකරුගේ ප්‍රකාශය හා අධිකරණ වෛද්‍ය වාර්තාවේ සඳහන් තුවාල අතර සැසඳීමක් ද පවතී. එමෙන්ම වෛද්‍යවරයාගේ මතය වී ඇත්තේ තුවාල හා රෝගියාගේ ඉතිහාසය සමඟ සැසඳීමක් පවතින බවය.

වගඋත්තරකරුවන්ගේ ක්‍රියාවන් හේතුවෙන් පැමිණිලිකරු වධහිංසාවට ලක් වූයේද යන්න මතයක් ගොඩනැගීමට ඇති ප්‍රබලම සාක්ෂිය වන්නේ, අධිකරණ වෛද්‍ය නිලධාරීන්ගේ වෛද්‍ය වාර්තාව වේ. වධහංසාවකදී විශේෂඥ සාක්ෂි යොදා ගැනීම වඩා හොඳම පිළිගැනීම වුවද, පැමිණිලිකරුව අත්අඩංගුවට ගැනීමට කටයුතු කිරීමේදී ඔහුගේ හැසිරීම හා ඔහුගේ ක්‍රියාවන්ද පාලනය කිරීම සඳහා වගඋත්තරකරුවන්ට බලයක් පවතී. වරදක් සිදුකර අත්අඩංගුවට පත් වූ පුද්ගලයෙකුට පැනයාමට ඉඩ නොදී ඔහුව වගඋත්තරකරුවන්ගේ භාරයේ රඳවා ගැනීමද වගඋත්තරකරුවන්ගේ රාජකාරියේ කොටසකි. මෙහිදී පැමිණිලිකරු විසින් වගඋත්තරකරුවන්ට අවනත නොවී ඔහුගේ හැසිරීම හා ක්‍රියාවන් තුළින් සිදුකර ගන්නා ලද තුවාලයක් වේ නම් එම තුවාල වගඋත්තරකරුවන්ගේ භාරයේ සිටියදී සිදු වූ තුවාල ලෙස පිළිගැනීමට හැකිය.

"ඇනස්ලි ප්‍රනාන්දු එ. පොලිස් ස්ථානාධිපති සරත් පෙරේරා, හලාවත පොලිස් ස්ථානය සහ තවත් අය නඩුවේදී පොලීසිය පහරදීම ප්‍රතික්ෂේප කිරීම නිසා හෝ අගතියට පත් පාර්ශවයට තම තුවාල පිළිබඳ වෛද්‍ය සාක්ෂි හෝ වාර්තා ඉදිරිපත් කිරීමට නොහැකි වීම නිසා එවැනි වධහිංසාව සම්බන්ධව චෝදනා ප්‍රතික්ෂේප කළ නොහැක" වශයෙන් දක්වා ඇත.

**නිගමනය :-**

පැමිණිලිකරුගේ ශරීරයේ පවත්නා තුවාල වගඋත්තරකරුවන්ගේ ක්‍රියාවන් හේතුවෙන් සිදු නොවූ තුවාල වන බවට වගඋත්තරකරුවන් විසින් තර්කයක් මතු කළද, පැමිණිලිකරු සම්බන්ධයෙන් ඉදිරිපත්ව ඇති වෛද්‍ය වාර්තාව අනුව හා පැමිණිලිකරු දක්වන පහරදුන් ආකාරය හා තුවාල සැසඳෙන බැවින් වධහිංසාව සම්බන්ධයෙන් වගඋත්තරකරුවන් වෙත වගකීම පැවරෙනු ලැබේ. ඒ අනුව වගඋත්තරකරුවන්ගේ ක්‍රියාවන් හේතුවෙන් පැමිණිලිකරුගේ 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයේ 11 වන ව්‍යවස්ථාවෙහි සඳහන් මූලික අයිතිවාසිකම උල්ලංඝනය වී ඇති බවට මානව හිමිකම් කොමිෂන් සභාව මෙයින් නිගමනය කරනු ලැබේ.

**නිර්දේශය :-**

ඒ අනුව, වගඋත්තර පාර්ශවයේ ක්‍රියාකලාපය හේතුවෙන් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 වන ව්‍යවස්ථාවේ සඳහන් මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බැවින්, පහරදීමට සම්බන්ධ

වගඋත්තරකාර උ.පො.ප අසංක, පො.කො 86732 මිලාන් ප්‍රේමතිලක, හා පොලිස් සැරයන් 59629 විජේකුමාර, යන නිලධාරීන් සම්බන්ධයෙන් සුදුසු විනය පියවර ගැනීමට කටයුතු කළ යුතු බවට පොලිස්පතිවරයා වෙත මෙයින් නිර්දේශ කරනු ලැබේ.

2023.03.10 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15(7) වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම්දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

A. Shanmuganathan

අනුසූයා ෂන්මුගනාදන්,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Ms. Anusuya Shanmuganathan
Commissioner
Human Rights Commissioner of Sri Lanka

ආචාර්ය විජිත නානායක්කාර,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Dr. Vijitha Nanayakkara
Commissioner
Human Rights Commission of Sri Lanka

පිටපත :- 01. අමාත්‍යතුමා,
මහජන ආරක්ෂක අමාත්‍යංශය,
14 වන මහල, සුහුරුපාය, බත්තරමුල්ල.

02. පොලිස්පතිතුමා,
පොලිස් මූලස්ථානය,
කොළඹ 01.

03. නීතිපතිතුමා,
නීතිපති දෙපාර්තමේන්තුව,
අලුත්කඩේ, කොළඹ 12.

04. මා.හි.කො.ස ප්‍රාදේශීය කාර්යාලය,
අනුරාධපුර.

B/